සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019


## 11 ශ්‍රේණිය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

නම/විභාග අංකය :-- ..............................................................................

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4ක් ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.





01. මේ දිනවල පවත්නා ආරක්ෂක තත්ත්වය සැලකිල්ලට ගෙන වීරමාතා විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අංශය සහ දෙමාපිය සංගමය එක්ව ශිෂ්‍ය පැමිණීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් පාසල් ගේට්ටුවට සකස් කර දෙන ලදී. 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සමන් ඇඟිලි සලකුණු යන්ත්‍රයට ඇඟිල්ල තැබූ විට විටින් විට යන්ත්‍රය පහත පනිවිඩ ප්‍රදර්ශනය සහ හඬ නිකුත් කරන ලදී.




1) මින් ලැබෙන පණිවිඩ ආදානයක් ද ප්‍රතිදානයක් ද සැකසුමක් ද යන වග ඊට අදාළ අක්ෂරය සමග ලියා දක්වන්න.
2) මෙම උපකරණය තුළ ඇති ආදාන හා ප්‍රතිදාන උපාංගය බැගින් ලියන්න.

ii) BEAR යන වචනය ASCII කේතයෙන් නිරූපණය වන බිටු 7 බැගින් වෙන් කළ ද්විමය අගය 1100110110100111001011111010 වේ. එහි දශමය අගය පිළිවෙලින් 66, 69, 65 සහ 82 වේ. BEST යන වචනයට අදාළව ද්විමය නිරූපිත අගය බිටු 07 බැගින් යොදා ලියන්න.

iii) සඳරේනුගේ උපන් දිනයට ඇගේ පියා මේස පරිගණකයක් තෑගි ලෙස ලබා දුන් අතර ඇය එම පරිගණකයේ ඇසුරුම ඉවත් කොට පද්ධති ඒකකයේ කෙවෙනි පරික්ෂා කිරීමේදී වගුවේ දක්වෙන සලකුණු සහිත කෙවෙනි දක්නට ලැබුණි. ඇයට ඉටු කර ගත යුතු කාර්යයන් පහත වගුවේ දක්වේ. එම කාර්යයන් සඳහා ගැලපෙන කෙවෙනියට අදාළ අංකය හා කාර්යය අක්ෂරය ගලපන්න.

| අංකය | සංකේතය |
|---|---|
| 1 |  |
| 2 |  |
| 3 |  |
| 4 |  |



ictnotes.org

| අක්ෂරය | කාර්යය |
|---|---|
| A | LED මොනිටරයක් පරිගණකයට සම්බන්ධ කිරීම |
| B | අන්තර්ජාල රව්ටරයක් රැහැන් මගින් පරිගණකයට සම්බන්ධ කිරීම |
| C | PS/2 යතුරු පුවරුවක් සවි කිරීම |
| D | USB මව්සය පරිගණකයට සවි කිරීම |

iv) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිත කොට හැඩගැන්වීමට පෙර සහ පසු පහත පාඨ කොටස සලකන්න. මෙම හැඩසවි ගැන්වීම සඳහා යොදාගෙන ඇති මෙවලම් දෙකක් නම් කරන්න.

| හැඩ සවි කිරීමට පෙර | හැඩ සවි කිරීමට පසු |
|---|---|
| I කොටසේ ඇති ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන යෙදුම II කොටසින් තෝරා ලියන්න.<br>I කොටස<br>හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුණා වාගේ<br>අහසට ඉණිමං බඳිනවා වගේ<br>ලූලා නැති වළට කණයා පණ්ඩිතයා<br>නියර මිටි තැනින් වතුර බහිනවා වගේ<br>ගඟෙන් වතුර බී මුහුදට ආවැඩීම. | I කොටසේ ඇති ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන යෙදුම II කොටසින් තෝරා ලියන්න.<br>I කොටස<br>i. හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුණා වාගේ<br>ii. අහසට ඉණිමං බඳිනවා වගේ<br>iii. ලූලා නැති වළට කණයා පණ්ඩිතයා<br>iv. නියර මිටි තැනින් වතුර බහිනවා වගේ<br>v. ගඟෙන් වතුර බී මුහුදට ආවැඩීම. |

v) පහත ලැයිස්තුවෙන් ඉහත එක් එක් ක්‍රියාකාරකම සඳහා වඩාත්ම ගැලපෙන සන්නිවේදන ක්‍රමය හඳුනා ගන්න සංසිද්ධියට අදාල අක්ෂරය හා සන්නිවේදන ක්‍රමය ගලපන්න.

a. පාසල් ප්‍රදර්ශනයක තොරතුරු සජීවී වීඩියෝ දර්ශන අන්තර්ජාලය මගින් විකාශනය කිරීම.
b. විදුහල්පතිවරයකු පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා සකසන ලද ආරාධනා පත්‍රයේ මෘදු පිටපත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාටත් සෙසු අධ්‍යක්ෂවරුන්ටත් යැවීම
c. දරුවන් පාසලට පැමිණි බව දන්වන පණිවිඩය ඉතා ඉක්මනින් දෙමාපියන්ට දන්වා යැවීම
d. ප්‍රධාන ව්‍යාපාරික ආයතනයක කළමනාකාර අධ්‍යක්ෂ එහි දිවයින පුරා පිහිටි ශාඛා කළමනාකරුවන් සමග ප්‍රගති පිළිබඳ සාකච්ඡා කිරීම.

(සමාජ ජාල, විද්‍යුත් තැපැල, සජීවී විකාශනය live streaming, ක්ෂණික පනිවිඩ ක්‍රමය, වීඩියෝ සම්මන්ත්‍රණ Video conferencing)

vi) පද්ධති සංවර්ධන ජීවන චක්‍රය තුළ
(a) පද්ධතිය පිහිටුවීම සඳහා භාවිතා වන ක්‍රම දෙකක් ලියන්න.
(b) ඔබ සඳහන් කළ ක්‍රම දෙකෙහි වෙනස්කම් සසඳන්න.

vii. පහත ව්‍යාජ කේතයට අනුව එම අගයන් කී වතාවක් මුද්‍රණය වේ ද?

```
P=1
Q=0
while P<=2 do
while Q<=1 do
print (P*Q)
Q=Q+1
end while
P=P+1
end while
```

viii) වලාකුළු පරිගණක (cloud computing) භාවිතයේ වාසියක් සහ අවාසියක් සඳහන් කරන්න.


ix. පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට වඩාත්ම ගැලපෙන මෘදුකාංගය ක්‍රියාකාරකම් අක්ෂරය හා ගලපන්න.
a) පාසලේ පැවැත්වෙන උත්සවයක් ප්‍රචාරක හඬපටයක් සංස්කරණය කිරීම
b) පාසල ලබාගත් ජයග්‍රහණයක් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අංකිත බැනරයක් සැකසීම
c) පාසල් වෙබ් අඩවියේ ආරම්භය සඳහා පාසල් ධජයේ සජීවීකරණ සටහනක් නිර්මාණය
d) පාසල පිළිබඳ වාර්තා චිත්‍ර පටයක් සැකසීම
(YOU TUBE REMIXER, AUDACITY, GIMP, VECTROIAN GIOTTO)



ictnotes.org

x) සුහුරු නිවාසයක ගේට්ටුව අසල ඇති විදුලි බුබුලු ක්‍රියාත්මක කිරීම සඳහා කාලගණකයක් යාන්ත්‍රික ස්විචයක් හා චලන සංවේදයක් සම්බන්ධ කර ඇත. එහි ක්‍රියාකාරීත්වය පහත පරිදි වේ.

> කාලගණකය රාත්‍රී 6 සිට උදෑසන 6 දක්වා සක්‍රිය වේ(1).අනෙක් අවස්ථාවල අක්‍රියව පවතී. විදුලි බුබුලු ක්‍රියාත්මක වීමට කාලගණකය සක්‍රියව තිබීම අත්‍යවශ්‍ය වේ.
>
> චලන සංවේදකය මගින් චලනයක් හඳුනාගන්නා අතර චලනයක් සිදුවූ විට එය සක්‍රිය වී විදුලි බුබුලු ක්‍රියාත්මක වේ. ඒ සඳහා කාල ගණකය සක්‍රියව තිබිය යුතුය.
>
> යාන්ත්‍රික ස්විචය සක්‍රිය කිරීමෙන් විදුලි බුබුලු ක්‍රියාත්මක කල හැකි අතර ඒ සඳහා කාල ගණකය සක්‍රියව තිබිය යුතුය.




ඉහත A සහ B සඳහා යොදා ගත හැකි තාර්කික ද්වාරය සඳහන් කරන්න.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන අආයතනය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට Bg407H නමින් මාස 4 වයස් කාණ්ඩය යටතේ දෙමුහුම් වී ප්‍රභේදයක් හඳුන්වා දී ඇත. ඊට අදාළව ඒ සඳහා යෙදිය යුතු පොහොර ප්‍රමාණයන් (අක්කරයට කිලෝ ග්‍රෑම්) දක්වෙන පැතුරුම් පත් කොටසක් පහත වේ.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | | අක්කරයට කිලෝ ග්‍රෑම් | | | | | |
| 2 | පොහොර යෙදිය යුතු අවධි | යූරියා | සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑෂ් | සින්ක සල්ෆේට් | මුළු පොහොර | |
| 3 | බිම් සැකසීම | 5 | 50 | 20 | 2 | 77 | |
| 4 | පැල සිටුවා සති 2 | 25 | | | | 25 | |
| 5 | පැල සිටුවා සති 5 | 35 | | | | 35 | |
| 6 | පැල සිටුවා සති 7 | 45 | | 20 | | 65 | |
| 7 | මල්පිපෙන විට | 15 | | | | 15 | |
| 8 | සාමාන්‍ය පොහොර ප්‍රමාණය( අක්කරයට කිලෝ ග්‍රෑම්) | | | | | | |

i. බිම් සැකසීමේදී අක්කර 1 ක භූමි ප්‍රමාණයකට යෙදිය යුතු මුළු පොහොර ප්‍රමාණය F3 කෝෂයට ලබා ගැනීමට ලිවිය යුතු ශ්‍රිතය ඇතුළත් සූත්‍රය ලියන්න.

ii. පැල සිටුවා සති 7 දී යෙදිය යුතු පොහොර ප්‍රමාණය සෙවීමට ඉහත සූත්‍රය F6 කෝෂයට පිටපත් කළේ නම් එහි දක්වෙන සූත්‍රය ලියන්න.

iii. බිම් සැකැස්ම සඳහා භාවිත කරන පොහොර වර්ග ගණන සෙවීමට G3 කෝෂයට ලියන ශ්‍රිතය සඳහන් කරන්න.

iv. බිම් සැකසීමේ සිට මල් පිපීම දක්වා වගාව සඳහා භාවිත වන පොහොර ප්‍රමාණයේ සාමාන්‍ය අගය සෙවීමට F8 ලියන සූත්‍රය කුමක් ද?

v. බිම් සැකැස්මේදී එක් එක් පොහොර ප්‍රභේද යෙදිය යුතු ප්‍රමාණ පිළිබඳ සරල අවබෝධයක් ලබා ගැනීමට ගොවීන්ට ලබා දෙන අත් පත්‍රිකාවකට භාවිතා කිරීමට සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක් නම් කරන්න.

ictnotes.org

3. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල්වල ශිෂ්‍ය තොරතුරු විධිමත් කිරීම සඳහා සකස් කරන ලද NSIS නම් වූ දත්ත පාදකයේ මහ කණ්ඩිය ප්‍රාථමික විද්‍යාලයේ පළමු ශ්‍රේණිය දරුවන්ගේ තොරතුරු ඇතුළත් කර ඇති වගු කීපයක් පහත දැක්වේ.

භාරකරු වගුව

| භාරකරුගේ නම | ස්ත්‍රී/පුරුෂ බව | භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|
| A.D Jayaweera | Male | 7723109003V |
| P.K Kumara | Male | 7587722032V |
| A.P.Perera | Male | 7687922031V |
| Kamala Silva | Female | 8089765344V |
| K.V Sandamali | Female | 7956789234V |

ශිෂ්‍ය වගුව

| ශිෂ්‍යාගේ නම | ස්ත්‍රී/පුරුෂ බව | උප්පැන්න සහතික අංකය | උපන් දිනය | පන්තිය | භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය | භාරකරුගේ සම්බන්ධය |
|---|---|---|---|---|---|---|
| P.K Amal | Male | 7575 | 01/05/2014 | 1A | 7587722032V | Father |
| Amali Jayaweera | Fe male | 9867 | 03/05/2013 | 1B | 7723109003V | Father |
| Nimal Silva | Male | 7063 | 11/06/2013 | 1A | 8089765344V | Mother |
| K.V Supuni | Female | 7579 | 01/09/2013 | 1C | 7956789234V | Mother |
| A.P. Chinthaka | Female | 9868 | 21/07/2013 | 1A | 7687922031V | Father |
| P.K.Nimala | Female | 7576 | 01/05/2014 | 1C | 7587722032V | Father |

විෂය වගුව

| ශිෂ්‍ය අංකය | උප්පැන්න සහතික අංකය | සිංහල | ගණිතය | ආගම | ඉතිහාසය |
|---|---|---|---|---|---|
| 1001 | 7575 | Skill Complete | Skill Not Complete | Skill Complete | Skill Complete |
| 1002 | 9867 | Skill Complete | Skill Complete | Skill Complete | Skill Complete |
| 1003 | 7063 | Skill Complete | Skill Not Complete | Skill Complete | Skill Complete |
| 1004 | 7579 | Skill Complete | Skill Complete | Skill Complete | Skill Complete |
| 1005 | 9868 | Skill Not Complete | Skill Not Complete | Skill Complete | Skill Complete |
| 1006 | 7576 | Skill Complete | Skill Complete | Skill Complete | Skill Complete |

Skill Not Complete නිපුණතාවට පැමිණ නැත.

Skill Complete නිපුණතාවට පැමිණ ඇත.

i. ප්‍රාථමික යතුරු දෙකක් අදාළ වගු සමග නම් කරන්න.

ii. ආගන්තුක යතුරක් අදාළ වගු සමග නම් කරන්න.

iii. ශිෂ්‍යයාගේ නම සමග මව දෙමාපියන්ගේ නම ඇතුළත් විමසුමක් ලබා ගැනීමට සම්බන්ධ කළ යුතු වගු මොනවා ද?

iv. DEHEMI AMASHA තවත් ශිෂ්‍යාවක් මෙම ශ්‍රේණියට ඇතුළත් කළ අතර ඇගේ පියා A.D. JAYAWEERA වේ. හැඳුනුම්පත් අංකය 7723109003V වේ. මෙම තොරතුරු ඇතුළත් කිරීමට යාවත්කාලීන කළ යුතු වගු මොනවා ද?

v. එම වගුවල කවර ක්ෂේත්‍ර යාවත්කාලීන කළ යුතු ද?



ictnotes.org

4. රෝහලේ පැවැත්වෙන මාතෘ සායනවල තොරතුරු විද්‍යුත් තොරතුරු පද්ධතියක් බවට පත් කිරීම සඳහා වෛද්‍ය අධිකාරිතුමා මාසික රැස්වීමේදී පහත සඳහන් පරිදි සාකච්ඡා කොට ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන හෙද නිලධාරිතුමිය මෙ තොරතුරු පද්ධතිය අවශ්‍යතා හඳුනා ගැනීම පැවරුණි. වෛද්‍ය නිලධාරි රසික මහතා අවශ්‍යතා අනුව පද්ධතිය සැලසුම් කිරීම වගකීම භාරගත් අතර ඖෂධවේදී කපිල මහතා මෘදුකාංග ඉංජිනේරුවකු වන සිය පුතු ලවා අවශ්‍ය මෘදුකාංග සපයා දීමට එකඟ විය. බාහිර රෝගී අංශයේ හෙද නිලධරි සඳුන් සහ කමනි මෘදුකාංග පරීක්ෂා කිරීමට පොරොන්දු විය. මාතෘ සායනය බාර වෛද්‍ය ගුණරත්න මහතා සිය ඒකකය සඳහා මෘදුකාංග ස්ථාපනය කරන ලදී. මාස කිහිපයකට පසු වෛද්‍ය ගුණරත්න මහතා දක්වන ලද අදහසක් අනුව මෙතෙක් පැවති මාතෘ සායන අංකය මගින් මව හඳුනා ගැනීම වෙනුවට මවගේ අත සුපරීක්ෂකය මගින් හඳුනා ගත හැකි පරිදි පද්ධතිය කපිල මහතාගේ පුත්‍රයා නැවත සකස් කර දෙන ලදී.

a) වෛද්‍ය ගුණරත්න මහතා ඉටු කරනු ලැබුවේ පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කවර කාර්යයක් ද?

b) අත්ල සුපරීක්සනය මගින් මව හඳුනා ගැනීම සඳහා සිදු කරන වෙනස්කම අයත් වන පද්ධති සංවර්ධන ක්‍රියාව නම් කරන්න.

c) ප්‍රධාන හෙද නිලධාරිතුමියට මෙම පද්ධතියේ අවශ්‍යතා හඳුනා ගැනීමට යෙදිය හැකි ක්‍රම දෙකක් ලියන්න.

d) මෙම පද්ධතිය පිහිටුවීම සඳහා අවශ්‍ය වන දෘඩාංග සහ උපකරණ වාර්තාව ප්‍රධාන වෛද්‍ය නිලධාරියාට ලබා දිය යුත්තේ කව්ද?

e) පද්ධතිය පිහිටු වීමෙන් පසු ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමා කාර්ය මණ්ඩලයට පහත උපදෙස් ලබා දෙන ලදී.
"ඉදිරියටද මාතෘ සායනයේ සියලු සටහන් පෙර පරිදි ලේඛන ගතව තබාගන්න" වෛද්‍යතුමාගේ මෙම ප්‍රකාශය අනුව රෝහලේ පද්ධතිය පිහිටුවූ ක්‍රමය කුමක් ද?

f) පොදුවේ භාවිත වන සමර්පන මෘදුකාංගයක් භාවිතයෙන් කදා 5 කින් සමන්විත විද්‍යුත් සමර්පණයක් සකස් කර ගැනීමට අවශ්‍ය වී ඇත.





Figure 8.6.3 - Office Theme

A රූපය





B රූපය

i) A රූපය අනුව මාතෘකාවක් සහ උප මාතෘකාවක් යෙදීමට වඩාත්ම සුදුසු කදා ප්‍රරූපයට අදාළ නම ලියන්න.

ii) B රූපයේ දක්වෙන්නේ කදා අතුරු මුහුණතකින් ලබාගත් වෙලම් කිහිපයක් ඉහත දක්වේ. එවා භාවිතයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු දෙන්න.
1. සංස්කරණය කිරීමෙන් පසු අදාළ කදාවේ කදා දක්ම ලබා ගැනීම අදාළ මෙවලම දක්වෙන අංකය ලියන්න.
2. මෙම කදා 5 සැකසීමෙන් පසු අනුපිළිවෙල යළි පෙලගැස්ම සඳහා වඩා පහසු දක්මට අදාළ අංකය ලියන්න.
3. අංක 3 මගින් දක්වෙන්නේ ............................ කදා දක්ම වන අතර එමගින් ................... කාර්යය ඉටු කර ගත හැක.

5. අන්තර්ජාලයේ මෙහෙයුම සිදුවන ආකාරය පහත සටහනේ දැක්වේ.
මෙම සටහනේ අංක 1 ස්ථානයට අදාළ ක්‍රියාව වන්නේ F ප්‍රකාශය වන පරිශීලක වෙබ් අතිරික්සුව විවෘත කොට URL ඇතුල් කිරීමය. මේ අනුව අංක 2, 3, 4, 5, 6 ස්ථානවලට ගැලපෙන ක්‍රියාවට අදාළ ඉංග්‍රීසි අක්ෂරය අංකයට ගලපන්න.







4096
ictnotes.org

a) වෙබ් සේවාදායකයා මගින් HTML දත්ත ප්‍රවාහය ආපසු ලබා දේ.
b) IP ලිපිනය ඇති වෙබ් සර්වරයට ඉල්ලීම යොමු වේ.
c) වෙබ් අතිරික්සුව මගින් HTML වෙබ් පිටුව දර්ශනය වේ.
d) DNS සර්වරය මගින් URL හි දැක්වෙන නමට අදාළ IP ලිපිනයකට පරිවර්තනය කරයි.
e) වෙබ් අතිරික්සුව URL එක DNS සර්වරයට යොමු කරයි.
f) පරිශීලක වෙබ් අතිරික්සුව විවෘතකොට URL ඇතුල් කිරීම


ii. ජනිත තම නිවසට එක්තරා ISP සමාගමකින් අන්තර්ජාල පහසුකම ලබා ගත් විට සමාගම RJ45 කෙවෙනි 5 සහිත WI-FI පහසුකම සහිත (ROUTER) මාර්ගකයක් සපයන ලදී.
a) ජනිතගේ උකුලු පරිගණකය මාර්ගකය හා සම්බන්ධ කළ හැකි මාධ්‍ය ප්‍රරූප (MEDIA TYPE) දෙකක් ලියන්න.
b) ජනිතගේ සහෝදරිය තම කාමරයේ සිට සිය සුහුරු ජංගම දුරකථනය මගින් මාර්ගතය හා සම්බන්ධ වීම සඳහා මුර පදයක් අවශ්‍ය බව කියයි. ඇය යොදා ගන්නා තාක්ෂණය සහ එහි යෙදෙන තරංග වර්ගය ලියන්න.
c) නිවසේ වෙනත් කාමරයක ඇති පියාගේ උකුළු පරිගණකයට සවිකර ඇති මුද්‍රණ යන්ත්‍රයක් භාවිතයෙන් ජනිත් සිය කාමරයේ ම සිට තම උකුලු පරිගණකයේ ඇති ලේඛනයක් මුද්‍රණය සඳහා යොමු කරයි. මේ සඳහා භාවිත කරන ලද ජාල වර්ගය හඳුන්වන්න.

6. පරිශීලකයා සහ පරිගණකය අතර සම්බන්ධතාව දක්වෙන අසම්පූර්ණ ආකෘති සටහනක් රූප සටහනේ දක්වේ.




a) 1) රූප සටහනේ P සහ Q හඳුන්වන්න
2) P ට සහ Q ට අයත් මෘදුකාංග දෙක බැගින් ලියන්න.
3) මෙහෙයුම් පද්ධතියක් තුළ භාවිතා වන උපයෝගිතා මෘදුකාංග දෙකක් ලියන්න.
b) රවීන් අන්තර්ජාලයෙන් සොයා ගත් තොරතුරු අනුව නවීන සුහුරු අත් ඔරලෝසුවක් මාර්ගගත සාප්පුවකින් (Online shopping) ගෙන්වා ගන්නා ලදී. මෙහිදී රවීන්ට ලැබෙන වාසියක් සහ සිදුවිය හැකි අවාසියක් සඳහන් කරන්න.

7. වර්ෂා මානයක සතියේ දින 07 ක ලැබුණු වර්ෂාපතන ප්‍රමාණය ඇතුළත් කොට එම සතිය තුළ අඩුම වර්ෂාපතන අගය සොයා ගැනීමේ ගැලීම් සටහනක් පහත වේ.
R වැසි අගය වන අතර MIN අවම අගය වේ.
a) A, B, C, D හිස්තැන් සම්පූර්ණ කරන්න
b) අදාළ ව්‍යාජ කේතය ලියන්න






ictnotes.org